මගේ අංකය / எனது இல. / My No. RG/IAB/COM/10

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊමේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2016.10.26

චක්‍රලේඛ අංක : 10 / 2016

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් (ප්‍රාදේශීය ලේකම්වරුන්),
මධ්‍යම ලේඛනාගාරය ඇතුළු කලාප කාර්යාලවල සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම ලේඛනාගාරය, කලාප කාර්යාල, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයන්හි භාවිත කළ මුදල් භාරගැනීමේ A.86 කුවිතාන්සි පොත් විනාශ කිරිම.</u>**

"ලියවිලි විනාශකිරීම" යන මැයෙන් මවිසින් ඔබ වෙත එවන ලද 1987.02.11 දිනැති චක්‍රලේඛ අංක 2/87 හි (5) සහ එහි (අ), (ආ), (ඇ), (ඇ) යන කරුණු යටතේ ඇති උපදෙස් පමණක් මෙම චක්‍රලේඛය මගින් පහත සදහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

i. ඉහත සඳහන් කාර්යාලවල භාවිත කළ **A.86** රිසිට් පොතේ අවසන් රිසිට්පත නිකුත්කල දිනය 2012-12-31 දින හෝ ඊට පෙර දිනකදී නම් එම උපපත්‍රිකා පොත් පමණක් විනාශ කිරීමට මෙයින් අනුමැතිය ලබා දෙමි. එසේ විනාශ කිරීමේදී එම උපපත්‍රිකා පොත්වල මුල් අංක සහ අවසන් අංක වෙන වෙනම සඳහන් කරමින් ලැයිස්තුවක් සකසා මා වෙත එවීමට කටයුතු කරන්න.

ii. 2013-01-01 දිනට පසු භාවිතා කරන ලද A.86 උපපත්‍රිකා පොත් මාගේ අංක RG/IAB/COM/03 හා 2016-07-21 දින දරණ විගණන මාර්ගෝපදේශය 2016(1) හි අංක 1 යටතේ i, ii, iii, මගින් දක්වා ඇති ක්‍රම අනුගමනය කරමින් විගණනය කර විගණනයට භාජනය කළ කාලය තුළ මුදල් අයකිරීම්වල අඩුපාඩු ඌනතා හා අක්‍රමිකතා නොමැතිනම් පමණක් රිසිට් පොතේ අවසන් රිසිට්පත නිකුත්කල දින සිට වසර පහක් ගතවූ පසු භාවිතාකළ උපපත්‍රිකා පොත්වල(A 86) මුල් අංක සහ අවසන් අංක වෙන වෙනම සඳහන් කරමින් ලැයිස්තුවක් සකසා ඒවා විගණනය කළ බවට හා විගණන පරීක්ෂණ , වෙනත් විනය පරීක්ෂණ හෝ විමර්ෂණවලට අදාළ නොවන බවට සහතිකයක් ද සමග පිටපත් දෙකකින් යුතුව මාගේ අනුමැතියට යොමුකර මවිසින් අනුමැතිය ලබාදුන් පසු පමණක් විනාශ කිරීමට කටයුතු කර ඒ බව මා වෙත වාර්තා කරන්න.

iii. ඉහත i කරුණ අනුව 2012-12-31 දිනට පෙර භාවිතාකළ උපපත්‍රිකා පොත් හා ii කරුණ අනුව විනාශ කිරීමට මාගේ අනුමැතිය ලද උපපත්‍රිකා පොත් විනාශ කිරීමට හෝ නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලයට හෝ එම මණ්ඩලයේ නියෝජිතවරුන්ට විකිණීමට කටයුතු කළ හැකි අතර එසේ කිරීමේදී දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්(ප්‍රාදේශීය ලේකම්) හෝ මධ්‍යම ලේඛනාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර්

ජනරාල්ගේ හෝ කලාපය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදුකර විනාශ කළ බවට උපපත්‍රිකා පොත් ලේඛනයේ (G.A.N.20) හා ලේඛන විනාශ කිරීමේ ලේඛනයේ සටහන් තැබිය යුතුය.

iv. ඉහත සඳහන් පරිදි උපපත්‍රිකා පොත් විනාශ කිරීමේදී විගණන පරීක්ෂණ , වෙනත් විනය පරීක්ෂණ හෝ විමර්ෂණ වලට අදාළ උපපත්‍රිකා පොත් විනාශ නොකර එම කටයුතු සියල්ල අවසන් වන තෙක් අදාළ මධ්‍යම ලේඛනාගාරයේ ස.රෙ.ජ , කලාප භාර ස.රෙ.ජ, ඉඩම් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ පුද්ගලික ආරක්ෂාව යටතේ තබාගත යුතුය.

v. මෙම චක්‍රලේඛය ලද බව කරුණාකර දන්වා එවන්න.

.............................

ඊ.එම්.ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :-

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් | - දැ.පි. හා අ.ක.ස. |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ස්වදේශ කටයුතු අමාත්‍යංශය. | - දැ.පි. |
| අභ්‍යන්තර විගණක, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................... | - දැ.පි. හා අ.ක.ස. |
| විගණන අධිකාරී, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | - දැ.පි. |